කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

# බුද්ධ ධර්මය

11 ශ්‍රේණිය　　　　　　　　　　　　කාලය පැය 2 යි

01) සූත්‍රපිටකයේ තුන් සූත්‍රයට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. තුන් සූත්‍රයට අයත් සූත්‍රයක් ඇතුළත් වරණය වන්නේ,

i. අංගුලිමාල පිරිත　　iii. මහා මංගල පිරිත
ii. මෝර පිරිත　　iv. වැසි පිරිත

02) බෞද්ධ ශ්‍රාවක ජීවිතයේ ආරම්භය හා අවසානය පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද ?

i. සෝවාන් අරහත්　　iii. භව නිවන
ii. සමාධි ප්‍රඥා　　iv. ශ්‍රද්ධාව ප්‍රඥාව

03) පුද්ගල චරිත හයට අයත් නොවන්නේ

i. රාග චරිත　　iii. මෝහ චරිත
ii. මෛත්‍රී චරිත　　iv. ද්වේශ චරිත

04) සිතට හා කයට දැනෙන විඳීම හඳුන්වන්නේ

i. රූප ස්කන්ධය ලෙසය　　iii. සඤ්ඤා ස්කන්ධය ලෙසය
ii. වේදනා ස්කන්ධය ලෙසය　　iv. සංඛාර ස්කන්ධය ලෙසය

05) සිතෙහි ස්වභාවය තේරුම් ගෙන සිත දියුණු කිරීම සඳහා අපට වඩාත් ම උපකාරී වන්නේ

i. සීලය යි　　iii. අපචායනය යි
ii. භාවනාව යි　　iv. දානය යි

06) දස අකුසල කර්ම අතර මනෝ කම්මයට අයත් වූවකි

i. අභිධ්‍යාවය　　iii. පරුෂාවාචය
ii. මුසාවාදයය　　iv. අදත්තාදානය

07) ධම්ම පදයේ ගාථා ගණන

i. 423 කි　　iii. 432 කි
ii. 434 කි　　iv. 425 කි

08) ධර්ම රසයට, උපදේශයට, සදාචාරයට මුල්තැන දෙමින් ලියන ලද බුදුගුණාලංකාරය හා ලෝවැඩ සඟරා යන අගනා කෘති දෙක රචනා කළේ

i. අලගියවන්න මුකවෙට්ටිතුමා　　iii. බලංගොඩ ආනන්ද හිමි
ii. වීදාගම මෛත්‍රී හිමි　　iv. රණස්ගල්ලේ හිමි

The National e-Learning Portal for The General Education

09) ලැජ්ජාව ඇතිවීම, උන්මත්තකයන් වීම, නොයෙක් ලෙඩ රෝග ඇතිවීම, ශරීරය විරූපී වීම යනාදී විපාක සඳහා හේතුවන අකුසල කර්මය වන්නේ.

i. ප්‍රාණඝාතයයි
ii. මුසාවාදයයි
iii. මත්පැන් පානයයි
iv. කාම සේවනයයි

10) සත්වයාගේ ප්‍රතිසන්ධිය ලබාදීමට ඉවහල් වන්නේ

i. ජනක කර්මය යි
ii. උපස්ථම්භක කර්මය යි
iii. ගරුක කර්මය යි
iv. ආසන්න කර්මය යි

11) තරුෂි සාමාන්‍ය පෙළ විභාගය උසස් ලෙස සමත් වූයේ දිනපතා පාසල් පැමිණීම, ගුරුවරුන්ට කීකරුව හොඳින් ඉගෙනීම, එදිනෙදා අභ්‍යාස මැනවින් සිදු කිරීම වැනි බොහෝ හේතු නිසාය. මෙම සිදුවීමෙන් සිහිපත් වනුයේ බුදු දහමේ ඉගැන්වෙන,

i. චතුරාර්ය සත්‍යයයි
ii. පටිච්ච සමුප්පාද යයි
iii. ත්‍රිලක්ෂණ ධර්මයයි
iv. අභිධර්මයයි

12) පොළොන්නරු යුගයේ විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙනුයේ,

i. තිවංක පිළිම ගෙයිනි
ii. මැදිරිගිරිය වටදාගෙයිනි
iii. පොත්ගුල් වෙහෙරෙනි
iv. පොළොන්නරුව වටදාගෙයිනි

13) සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ධර්ම ග්‍රන්ථයකි.

i. සද්ධර්මාලංකාරය
ii. ධම්ම පදය
iii. අමාවතුර
iv. සද්ධර්මරත්නාවලිය

14) මෙතෙක් ලොව පහළ වූ විවිධ දර්ශන අතර බුදු දහම වූ කලී,

i. අනුසෝතගාමී ප්‍රතිපදාවකි
ii. පටිසෝතගාමී ප්‍රතිපදාවකි
iii. පුබ්බේකත හේතුවාදී ප්‍රතිපදාවකි
iv. නිර්මාණවාදී ප්‍රතිපදාවකි

15) "අනිච්චාවත සංඛාරා - උප්පාද වය ධම්මිනෝ .........." යන ගාථා පාඨය ඇතුළත් සූත්‍රය වන්නේ,

i. වසල සූත්‍රයයි
ii. මංගල සූත්‍රයයි
iii. කරණීය මෙත්ත සූත්‍රයයි
iv. මහා පරිනිබ්බාන සූත්‍රයයි

16) මෙරට පමණක් නොව විදේශීය බෞද්ධ ජනතාවගේ ද ගෞරවාදරයට පාත්‍ර වූ "මහා සෑය" යන නමින් හැඳින්වෙන ස්තූපය වන්නේ,

i. අභයගිරි ස්තූපයයි
ii. ජේතවන ස්තූපයයි
iii. ථූපාරාම ස්තූපයයි
iv. ස්වර්ණමාලි ස්තූපයයි

17) ආර්ය මහා සංඝරත්නය මහා වූ පිළිවෙත් පුරන නිසා

i. සුපටිපන්න වේ
ii. උජුපටිපන්න වේ
iii. ආහුණෙය්‍ය වේ
iv. ඤායපටිසම්පන්න වේ.

18) පංච මහා විලෝකනය යනු

i. පංච ශීලය යි
ii. පස් මහ බැලුම් ය
iii. පංචස්කන්ධය යි
iv. පංචානන්තරි ය

19) බෞද්ධයෙකු වීමේ පළමු පියවර වන්නේ

i. පන්සිල් සමාදන් වීම ය
ii. පැවිදි වීම ය
iii. තෙරුවන් සරණ යාම ය
iv. අටසිල් සමාදන් වීම ය

20) බුදුරජාණන් වහන්සේගේ "පුරිස ධම්ම සාරථි ගුණය වර්ණනා කෙරෙන ගුරුළුගෝමී පඬිතුමා විසින් රචිත මා හැඟි ග්‍රන්ථය වන්නේ

i. බුත්සරණ
ii. ධර්ම ප්‍රදීපිකාව
iii. මුවදෙව්දාවත
iv. අමාවතුර

21) භාරතයේ පැවති හතරවන ධර්ම සංගායනාව වන සර්වාස්තිවාදි සංගීතියට අනුග්‍රහය දැක් වූ රජතුමා වන්නේ,

i. කනිෂ්ක රජතුමා ය
ii. ධර්මාශෝක අධිරාජයා ය
iii. අජාසත්ත රජතුමා ය
iv. කාලාශෝක රජතුමා ය

22) බුදු රජාණන් වහන්සේ පාරිලෙය්‍ය වනයෙහි වැඩවසමින් ඇතෙකුගේ හා වඳුරකුගේ උවටැන් ලබමින් ගත කළේ,

i. දහවන වස් කාලය
ii. අටවන වස් කාලය
iii. දහඅටවන වස් කාලය
iv. දහනව වන වස් කාලය

23) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම්සභා මණ්ඩපයක් බවට පත්කර ගත් අවස්ථාවකට නිදසුනකි

i. පටාචාරාවට දහම් දෙසුම
ii. අනුරුද්ධ හිමියන්ට දහම් දෙසුම
iii. දම්සක් පැවතුම් සූත්‍ර දේශනා කිරීම
iv. රාහුල හිමියන්ට දහම් දෙසුම

24) "උඩඟු නොව මහණ" යන වචන තුන ලියා පිවිසුම් දොරටුවේ අලවා තැබුවේ.

i. එස්. මහින්ද හිමි
ii. වල්පොළ ශ්‍රී රාහුල හිමි
iii. අසරණ සරණ සරණංකර හිමි
iv. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

25) සත්ත්වයා ඉපදෙමින්, මැරෙමින් පවත්නා ආකාරය දක්නා නුවණ

i. චුතූපපාතඥාණය වේ
ii. ආසවක්ඛය ඥාණය වේ
iii. පුබ්බේ නිවාසානුස්සති ඥාණය වේ
iv. දිබ්බචක්ඛු සෝත

26) පුද්ගලයාට රෝග වැළඳීමට බලපාන හේතු අටක් පෙන්වා දෙන සූත්‍ර දේශනාව වන්නේ

i. කරණීය මෙත්ත සූත්‍රය
ii. පරාභව සූත්‍රය
iii. ගිරිමානන්ද සූත්‍රය
iv. මහා මංගල සූත්‍රය

27) අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් අනුභව කරන තරමට ගිජු වූ තැනැත්තා

i. භුත්තවමිතකවේ
ii. කාකමාසක වේ
iii. හත්ථා වට්ටක වේ
iv. ආහාර හත්ථක වේ

28) ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී දුක්වලින් එතෙර වීම සඳහා සත්ත්වයනට මග පෙන්වන බැවින් බුදුරජාණන් වහන්සේ

i. බුද්ධ නම් වන සේක
ii. අරහං නම් වන සේක
iii. සුගත නම් වන සේක
iv. සත්ථා නම් වන සේක

29) බුදු දහමට අනුව '"සමවායෝ එව සාධු" යන්නෙන් අදහස් වන්නේ,

i. සමගියව යහපත් යන්නයි
ii. සමගි වන්න විවාද නොකරන්න යන්නයි.
iii. ධර්මයෙහි හැසිරෙන්න යන්නයි
iv. තනිව හැසිරෙන්න යන්නයි.

30) බුදුරජාණන් වහන්සේ ව්‍යාපාදය උපමා කොට ඇත්තේ

i. නටන ජලයට ය
ii. බොරවී ඇති ජලයට ය
iii. පාසි සහිත ජලයට ය
iv. පාට කළ වතුරට ය

31) බුදු දහමේ සඳහන් දසමාර සේනාවට අයත් නොවන පදය වන්නේ

i. ආත්ම වර්ණනාව
ii. සැකය
iii. බියගුළුකම
iv. ඊර්ෂ්‍යාව

32) බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ අවස්ථාවකට උදාහරණයක් නොවන්නේ,

i. මුගලන් මහරහතන් වහන්සේ
ii. පූතිගත්ත තිස්ස තෙරනුවන්
iii. උපාලි තෙරණුවන්
iv. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ

33) බුදුරජාණන් වහන්සේට අසදෘස මහා දානය පිළිගැන්වූයේ

i. කොසොල් රජතුමා
ii. බිම්බිසාර රජතුමා
iii. විශාඛාව සිටු දේවිය
iv. අනේපිඬු සිටුතුමාය

34) බුදුරජාණන් වහන්සේ පිළිබඳ ගුණ වර්ණනා කළ පිරිවැජියෙක් නො වන්නේ

i. චංකි පරිවැජියා
ii. සංජය පිරිවැජියා
iii. සෝණ දණ්ඩ පිරිවැජියා
iv. පොට්ඨපාද

35) බුදුකුරු දම් හඳුන්වන වෙනත් නමක් නොවන්නේ

i. පාරමී
ii. පාරමිතා
iii. බෝධි පාක්ෂික
iv. බුද්ධ කාරක ධර්ම

36) පාරමිතාවක් වීම සඳහා තිබිය යුතු ලක්ෂණ ගණන වන්නේ,

i. 2 කි
ii. 5 කි
iii. 10 කි
iv. 3 කි

37) බෝසතාණන් වහන්සේ දාන පාරමිතාව පිරූ අවස්ථාවකට අදාළ නොවන ජාතක කථාව වන්නේ

i. වෙස්සන්තර ජාතකය
ii. සිවි ජාතකය
iii. සස ජාතකය
iv. මඝ මානවක ජාතකය

38) බුදු දහමේ සඳහන් පංච කාම වස්තුවලට අයත් වන පදය තෝරන්න.

i. දුව
ii. රස
iii. ඇස
iv. කන

39) දීඝ නිකායේ සමඤ්ඤඵල සූත්‍රයේ දී 'වනයක අතරමං වූවකු' ලෙස දක්වා ඇති උපමාවෙන් සඳහන් වන පංච නීවරණය වන්නේ,

i. කාමච්ඡන්ද
ii. ව්‍යාපාදය
iii. විචිකිච්චාව
iv. ථිනමිද්ධ

40) සිංහල බෞද්ධයා පුවත්පත ආරම්භ කළ වර්ෂය වන්නේ

i. 1906 දීය
ii. 1900 දී
iii. 1905 දී
iv. 1919 දී

සැලකිය යුතුයි,

- පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
- පළමු ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 02 ක් බැගින් ලකුණු 20 කි.
- අනිකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 2, 3, 5 බැගින් ලකුණු 10 කි.

01) කෙටි පිළිතුරු සපයන්න.

i. ධර්ම විනය පිළිබඳව විශාරදයකු වූ වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසකි. ඒ අතරින් දෙකක් නම් කරන්න.

ii. බුද්ධ දේශනාවට අනුව පුද්ගලයා විසින් කර්ම සිදු කරන දොරටු තුනකි. ඉන් දෙකක් ලියන්න.

iii. දස අකුසල් අතරින් දෙකක් හඳුන්වන්න

iv. බුදු දහම පිළිබඳ ව ඇතිවන සංසන්දනාත්මක ඥානය හඳුන්වන නම කුමක් ද ?

v. සමථ භාවනාව සඳහා යොමු වීමේ දී තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

vi. "හේතුං පටිච්ච සම්භූතං - හේතුං භංගා නිරුජ්ඣති" යන පාඨයේ අදහස ලියන්න.

vii. විදර්ශනා භාවනාව හැඳින්වීම සඳහා භාවිතා කරන නම් දෙකක් ලියන්න.

viii. මිනිසා ඇතුළු ලොව පවත්නා සියල්ල බැලූ බැල්මට ඒකාකාරයෙන් පවතින ලෙස පෙනුන ද සැබෑ ආකාරය එය නොවේ. මේ පිළිබඳව යථා ස්වභාවය පැහැදිලි කළ බුදු දහමේ ඉගැන්වීම කුමක් ද ?

ix. සිතෙහි ස්වභාවය හා සිත කිළිටි කරන සිතිවිලි හඳුනාගත් තැනැත්තා සිත යහපතෙහි යොදවා සිතට පව් සිතිවිලි ඇතුලු වීමට ඉඩ නොදෙයි. ඒ සඳහා පුරුදු කළ යුත්තේ කුමක් ද ?

x. "තේමිය ජාතකය" නිරූපනය කරන පාරමිතා ධර්මය වන්නේ,

02) උත්සහවන්ත වූ , මනා සිහිය ඇති, නිවැරදි දෙය පරීක්ෂාකාරීව කරන හික්මීමෙන් යුත්, දැහැමිව ජීවත් වන තැනැත්තාගේ යසස වැඩෙන්නේය.

i. මෙම උපදේශය පෙන්වා දෙන ධම්මපද ගාථාව ලියන්න.

ii. මෙම ගාථාව කවුරුන් විසින් කා හට දේශනා කරන ලද්දක් ද ?

iii. එහි පෙන්වා දෙන සත් ආකාර ගුණ ධර්ම විස්තර කරන්න.

The National E-Learning Portal for The General Education

03) බුදු දහමේ මූලික හරය පැහැදිලි කරන දම්සක් පැවතුම් සූත්‍රය සත්වයා හා ලෝකය පිළිබඳ ව සත්‍යතාවය මනා ලෙස පැහැදිලි කරයි.

i. එම උතුම් සත්‍ය සතර නම් කරන්න.

ii. තුන් ආකාර වූ සසර දුක කෙටියෙන් පෙන්වා දෙන්න.

iii. මෙලොව ජීවිතයේ දී ඔබ මුහුණ පාන ගැටලු සහ ඒවාට පිළියම් යෙදීමට ඉහත සත්‍යතාවයන් ඉවහල් කරගත හැකි ආකාරය දක්වන්න.

04) බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි සුභ නම් මානවයකු සත්ත්වයන් උස් පහත් වශයෙන් බෙදීමට හේතු විමසන ලදි. එහි දී කර්මය යන සංකල්පය විග්‍රහ විය.

i. කර්මය යන්න පැහැදිලි කෙරෙන බුද්ධ ධර්මයේ සඳහන් සුප්‍රකට පාලි පාඨය කුමක් ද?

ii. එම පාඨයට අනුව කිසියම් ක්‍රියාවක් කර්මයක් වීමට බලපාන කරුණු කවරේ ද ?

iii. වර්තමාන කර්ම වලින් සහ පාරිසරික සාධක ඇසුරින් අතීත කර්ම ශක්තිය පාදා ගැනීමට හැකි සම්පත්ති හතර නම් කර විස්තර කරන්න.

05) නිර්මල ථෙරවාදී බුදු සමය රැක ගැනීම උදෙසා ශාසන ඉතිහාසය ගෙන ඇති හොඳ ම පියවර වනුයේ ධර්ම සංගායනා පැවැත්වීමය.

i. සංගායනාවක් යනු කුමක් ද ?

ii. ශ්‍රී ලංකාවේ පැවැත්වූ පුස්තකාරූඪ සංගීතය ලෙස හැඳින්වෙන්නේ කුමක් ද ?

iii. එම සංගායනාව පැවැත්වීමට හේතු පෙන්වා දෙමින් එහි ප්‍රතිඵල දෙස් විදෙස් බුදු දහමේ චිරස්ථිතියට හේතු වූ අන්දම විමසන්න.

06) පන්සිල් සුරකින සමාජය ඉතා දැහැමි ආදර්ශවත් සමාජයකි.

i. සීලය යන්නෙහි සරල අදහස ලියන්න.

ii. පංච ශීල ප්‍රතිපත්තියට අනුව කයින් හා වචනයෙන් සිදුවන අකුසල ක්‍රියා වෙන් කොට දක්වන්න.

07) උත්පල කුඩා අවධියේ සිටම විවිධ ගැටලු වලට මුහුණ දුන් ශිෂ්‍යයෙකි. දෙමාපිය සෙනෙහස අහිමි වීමත් දහසක් ආර්ථික ගැටලුත් ලෙස ජය ගෙන විශ්වවිද්‍යාලය දක්වා ම නොසැලී ගමන කළේය.

i. අභියෝග යනු කුමක්දැ යි නිර්මලගේ චරිතය ඇසුරින් කෙටියෙන් පහදන්න.

ii. බුද්ධ චරිතයෙහි අභියෝග ජයගත් අවස්ථා පහක් කෙටියෙන් සඳහන් කරන්න.

iii. යෞවනයෙකුට බුද්ධ චරිතය චරිතායනය කිරීමෙන් සාර්ථක ජීවිතයක් ගොඩනගා ගත හැකි ආකාරය නිදසුන් සහිතව විමසන්න.

19